C10

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2021/2022
අන්තර්ජාතික නීතිය - LLU5712
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II
කාලය - පැය එකයි. (01)

---

දිනය - 2022.09.15 වේලාව - ප.ව.03.30 - ප.ව.04.30

---

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.
මුළු ප්‍රශ්න ගණන 02 යි.
එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 20 ක් හිමිවේ.

01. "චාරිත්‍රානුකූල නීතියේ සාමාන්‍ය රීතිවලට වඩා ප්‍රබල ලෙස අනුලංඝනීය නියාමනයන් (*Jus cogens*) ඒවාට පටහැනි ක්‍රියා සහ සම්මුතීන් බලරහිත කරයි. මෙම බලය අනුලංඝනීය නියාමනයන්හි එක් වැදගත්ම ගුණාංගයකි."

*Akenurst's Modern Introduction to International Law, p.41*

ඉහත උපුටා දැක්වීම අන්තර්ජාතික නීතියේ මූලාශ්‍රයක් ලෙස අනුලංඝනීය නියාමනයන්හි සමකාලීන අදාලත්වය නිවැරදිව පිළිබිඹු කරන්නේ යැයි ඔබ සිතන්නෙහි ද? අදාල නඩු තීන්දු සහ අන්තර්ජාතික නීති ප්‍රමිතීන් මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

02. "අන්තර්ජාතික නෛතික පුද්ගලභාවය හා සම්බන්ධ මූලිකාංග හතරක් තිබේ. එනම්, සම්මුතීන් සැකසීමේ බලය (බොහෝ විට *Jus tractatuum* ලෙස හැඳින්වේ), රාජ්‍ය තාන්ත්‍රික දූතයින් යැවීමට සහ පිළිගැනීමට ඇති අයිතිය (*Jus leqationis*) අන්තර්ජාතික වගකීම මත පදනම්ව හිමිකම් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය සහ සන්නද්ධ බලය භාවිතා කිරීමට ඇති අයිතිය වේ."

*Wladyslaw Czaplinski, 'Recognition and International Legal Personality of Non-state Actors', Pecs Journal of International and European Law, Vol.01,2016,p.8.*

උක්ත ප්‍රකාශය අන්තර්ජාතික නෛතික පුද්ගලභාවයේ විදහාපාන ගුණාංගවල සමකාලීන අදාලත්වය නිවැරදිව පිළිබිඹු කරන්නේ ද? අදාළ නෛතික අධිකාරීන් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.